රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 21/2006(II)

මගේ අංකය:ආ/4/3/1/14-1
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2007.11.

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික,<br>අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත<br><u>බඳවාගත් සේවකයන් ස්ථිර කිරීම</u>**

ඉහත මැයෙන් යුත් 2007.07.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2006(I) න් සංශෝධිත 2006.12.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2006 පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

02. III (ආ)

අදාළ තනතුරේ බඳවා ගැනීම් පරිපාටියේ නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති වුවද පුරප්පාඩු තනතුරක 2007.06.30 දිනට සතුටුදායක සහ අඛණ්ඩව අවුරුදු තුනක (03) සේවා කාලයක් සපුරා ඇති සේවකයින්ට, රජයේ පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාළ පුහුණු වැඩසටහනකට සහභාගි වී සහතිකයක් ලබාගැනීමෙන් අනතුරුව පුරප්පාඩු තනතුරුවල සේවා ස්ථිරත්වය පිරිනැමිය හැක.

03. එම චක්‍රලේඛයේ III (ඇ) ඡේදයේ පාඨමාලා පවත්වා කටයුතු අවසන් කළයුතු දිනය 2007.12.31 වශයෙන් ද සංශෝධනය කරනු ලැබේ.

04. සහන පදනම මත පත්වීම් ලබාදී ඇති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006 සහ 21/2006(I) අවශ්‍යතා සපුරා ඇත්තාවූද, දෛනික වැටුප් ගෙවනු ලබන්නාවූද, සේවකයින්ද ස්ථිර කළහැකි බව දන්වනු කැමැත්තෙමි.

05. මින් ඉදිරියට අදාළ තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා නොමැති අය තාවකාලික, අනියම්, ආදේශක, සහන හෝ කොන්ත්‍රාත් පදනමින් වුවද බඳවා නොගත යුතුය. එලෙස බඳවා ගැනීමට කටයුතු කරනු ලැබුවහොත්, එසේ ක්‍රියාකිරීමේ වගකීම අවස්ථාවෝචිත පරිදි පත්කිරීම් බලධරයා සහ/හෝ පත්වීම් ලිපිවලට අත්සන් තබන නිලධරයා විසින් දැරිය යුතුය.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය